

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| 57 වන කාණ්ඩය | බු.ව. 2558 නිකිණි මස පුරපසළොස්වක ද ක්‍රි.ව. 2014 අගෝස්තු මස 10 වන ද | 04 වන කලබ |
|---|---|---|

# ඔබ යි මහා බලවේගය මෙ දැයේ



සිරිමත් සිරි දම්පල් නාමේ
සිරි ලක් දිවැ යුග යුග ගානේ
හෙළ දැය ඔසොවන, ගන'ඳුර දුරලන
මහා මතුර, බලවේගය වේ

ඔබේ අබිරු හඬ හෙළය සිසාරා
ඔබේ සුවිරු කම් හද එඩි මොළොවා
නව පරපුරකට නව පණ දෙනු ඇත
බස - රැස - දෙස සසුන ද සුරකින්නට

**- අනඳ**



# වස් විසීම

**අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක මහාස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.**

## අයං වස්සාන කාලො

හේමන්ත - ගිම්හාන - වස්සාන යැයි අවුරුද්දේ දෙළොස් මාසය තුනකට බෙදෙයි. ඉල්මස අවපෑළවිය (පසළොස්වක පොහෝ දිනට පසුදින) පටන් මැදින් මස පසළොස්වක් පොහොය දක්වා සාරමස් කාලය හේමන්ත සෘතුව ය. මැදින් මස අවපෑළවිය පටන් ඇසළ මස පුණු පොහොය දක්වා සාරමස් කාලය ග්‍රීෂ්ම සෘතුව ය. ඇසළ මස අව පෑළවිය පටන් ඉල්මස පුණු පොහොය දක්වා සාරමස් කාලය වස්සාන සෘතුවයි.

භාරතයෙහි (දඹදිව) මේ සෘතු පෙරළිය අද ද පෙර සේ ම සිදුවෙයි. හේමන්ත සෘතුව ආරම්භයේ දී සෞම්‍ය වුවත් මධ්‍යයෙහි දී කිව නොහැකි තරම් අධික ශීතක් ඇති වෙයි. ග්‍රීෂ්ම සෘතුවෙහි උෂ්ණය ද එසේ ම කිව නොහැකි තරම් ය. වස්සාන සෘතුව වූ කලී අතරක් නොතබා ම තදින් වසින කාලය යි. වස්සාන සෘතුවේ හැර අන් කාලයන්හි වැහි වැටීම සාමාන්‍ය ස්වාභාවය නොවන හෙයින් අන් කාලයන්හි වහින වැස්සට අකාල මේඝ යැ යි කියති. නිල්වන් ප්‍රාණවත් තණ කොළ හා ගස්වැල් දක්ක හැක්කේ වස්සාන කාලයේ දී පමණ ය.

## පළමු වස් විසීම

බුදුරජාණන් වහන්සේ ඇසළ මස පුණු පොහෝද බරණැස ඉසිපතන්හි දී පස්වග මහණුන් ප්‍රධාන පිරිසට ධර්මචක්‍ර ප්‍රවර්තන සූත්‍රයෙන් ධර්ම දේශනා කොට පළමු වැසි සාරමස එහි ම වුසූ සේක. එතැන් සිට බොහෝ කාලයක් යනතුරු වස් විසීමේ නීතියක් නොතිබුණු නමුත් ආවේණික ධර්මයක් - බුදුන් රහතුන්ගේ ස්වාභාවික පුරුද්දක් ලෙස වස් කාලයෙහි චාරිකාවේ නො ගොස් එක තැනක ම වුසූහ.

කල් යත් යත් ම පෘථග්ජන භික්‍ෂු පිරිස වැඩි වෙත් ම රහතන් වහන්සේගේ ස්වාභාවික ගති සිරිත්වලට වඩා වෙනස් වූ ගති පැවතුම් ද ඇති විය. වස් කාලයේ එක තැනක විසිය යුතු යැ යි නීතියක් නොතිබුණු හෙයින් ඇතැම් භික්‍ෂූහු ඔබ මොබ ඇවිදින්නටත් පටන් ගත්හ. එහෙයින් ම වස් කාලයෙහි එක තැනක විසිය යුතු යැයි සිකපදයක් පනවන්නට සිදු විය.

## වස් විසුමේ ආරම්භය

වස් විසුමට සික පදයක් පැණවීම පිණිස හේතු වූයේ මහජන උද්ඝෝෂණය යි. ඒ උද්ඝෝෂණය කර තිබෙන්නේ එකල සමාජයේ පැවති හැඟීම් දෙකක් මුල් කර ගෙන ය.

බුදුරජාණන් වහන්සේට වඩා වයසින් ටිකක් වැඩි මහලු වූ නිගණ්ඨනාතපුත්‍ර ගේ ධර්මය එවකට රටේ ප්‍රචලිතව තිබුණේ ය. ඒ සමයවාදී පැවිද්දෝ වැසි කාලයෙහි එක තැන ම වෙසෙති. චාරිකාවෙහි නො යෙදෙති. ඒ සමය (ධර්මය) අසීමිත අවිහිංසා වාදයෙකි. එහෙයින් ම තණකොළ හා ගස් වැල්වලට පණ ඇතැයි ද ඒවා මැඩීම පාපයෙකැයි ද ඉගැන්වීම් කරන ලදී.

මේ විශ්වාසය තදින් බලපැවැත්වූ නිසා වැසි කාලයෙහි භික්ෂූන් ඔබ මොබ යන එන විට තණකොළ ආදිය පෑගෙනු දුටු මහජනයා "වැසි කාලයෙහි අන් හැම තාපසවරු ම එක තැනක වාසය කරති. පක්ෂීහු පවා කූඩු තනා ගෙන එක් තැන්ව වෙසෙති. එසේ වුව ද බෞද්ධ භික්ෂූහු වැසි කාලයෙහි ද චාරිකාවේ යෙදෙති. ඒකින්ද්‍රිය ජීවයක් (පණ) ඇති තෘණාදිය පාගා පව් රැස් කෙරෙති. මෙය කොතරම් නුසුදුසු ක්‍රියාවක් ද ? " කියා දෙස් නඟන්නට වූහ. මහජනයා නඟන මෙකී දෝෂාරෝපණය බුදුරජාණන් වහන්සේට ද අසන්නට ලැබිණ.

බුද්ධාගමයේ දක්වෙන පරිදි එකින්ද්‍රිය ප්‍රාණීන් ලෙස ලෝකයා විසින් සලකනු ලබන ගස් කොළන් ආදියට පණක් ඇතැයි පිළිගැනෙතත් සත්ත්වයනට මෙන් හිතක් තිබෙන බවක් නො පිළිගැනෙයි. එහෙයින් තෘණාදිය මැඩීම බුද්ධ ධර්මයේ හැටියට පාපයක් නො වෙයි. බුදුරජාණන් වහන්සේ ඒ කාරණය නො පිළිගනිතත් වස් කාලයෙහි එක තැනෙක වාසය කරන්නට **"අනුජානාමි භික්ඛවේ වස්සානෙ වස්සං උපගන්තුං"** මහණෙනි වස්සාන කාලයෙහි වස් එළඹීමට අවසර දෙමි - නියම කරමි යි ශික්ෂාපද පණවා වදාළ සේක.

## පෙරවස් හා පසුවස්

වස් විසිය යුතු යැයි නියම කිරීමෙන් පසු වස් විසිය යුත්තේ කවරදා දැයි ප්‍රශ්නයක් ඇති විය. එයට පිළිතුරු දේශනා කළ බුදුරජාණන් වහන්සේ පෙරවස් ය පසුවස් යැයි වස් විසීම් දෙකෙකැයි ද එය අසුවල් අසුවල් දිනයන්හි යැයි ද වදාළහ.

**"ද්වේමා භික්ඛවේ වස්සූපනායිකා පුරිමිකා ච පච්ඡිමිකා ච. අපරජ්ජුගතාය ආසාළ්හියා පුරිමිකා උපගන්තබ්බා මාසගතාය ආසාළ්හියා පච්ඡිමිකා උපගන්තබ්බා"** මහණෙනි පෙර වස් ය

පසු වස් යැයි වස් විසීම් දෙකකි. ඇසළ අවපෑළවිය දිනයෙහි - ඇසළ පුණු පොහොයට පසුවද පෙරවස් එළඹිය යුතු ය. ඇසළ පුණු පොහොයෙන් මසක් ගත වූ ද එනම් නිකිණි මස පුණු පොහොයට පසුවද පසුවස් එළඹිය යුතු ය.

පෙරවස් පවාරණය හෙවත් අවසානය වප් මස පුර පසළොස්වක් ද ය. පසුවස් පවාරණය ඉල් මස පුර පසළොස්වක ද ය. වැසි කාලයෙහි වස් එළඹෙන්නට නියම කර වදළ හෙයින් සුදුසු තැනක් ඇතොත් පෙරවස් හෝ පසුවස් හෝ එළඹිය යුතු ම ය. එහෙත් පසුවස් එළඹෙන්නේ යම්කිසි හදිසි බාධාවකින් පෙරවස වැළකුණොත් ය. පසුවස් සමාදන් වූවන් ගේ පවාරණය වස්සාන ඍතුවේ අවසානයේ පුණු පොහොද හෙයින් කඨිනයක් දීම හෝ ගැනීම නොකළ හැකි වේ.

## වස් වසන සෙනසුන

වස් විසුම සුදුසු තැනක ම කළ යුතු ය. එළිමහනෙහි විසීම හා රුක්මුල විසීම කෙලෙස් තවන උසස් ගුණයක් වුවත් එබඳු තැනෙක වස් විසීම නො කටයුතු ය. එය සුදුසු සෙනසුනක ම කටයුතු ය. මෙහි සුදුසු සෙනසුන නම් පියසි දොර කවුළු ආදිය ඇති වාසස්ථානය යි. එබඳු සේනාසනයක් නැත්නම් දයකයන් ලවා කැප සරුප් ලෙස කරවා ගත යුතු ය. එබඳු දයකයකුත් නැත්නම් කැප සරුප් ලෙස තමන් හෝ පිළියෙළ කර ගත යුතු ය. බුදුරජාණන් වහන්සේ ගේ කාලයෙහි වස් කාලය ළං වන විට භික්ෂූහු කර්මස්ථාන ද ලබාගෙන වස් විසුමට සුදුසු තැන් සොයා ගිය බව නොයෙක් කථා ප්‍රවෘත්තීන් ගෙන් පැහැදිලිව පෙනෙයි.

## වැසි සළුව

වැසි කාලයෙහි චාරිකාවෙහි නොයතත් පිඬු සිඟා යෑමෙහි යෙදුණු භික්ෂූහු අතර නොතබා වැටෙන වැස්සෙන් තෙමී පීඩා විඳින්නට වූහ. මෙය දුටු විසාඛා මහෝපාසිකාව "**ඉච්ඡාමහං සංඝස්ස යාවජීවං වස්සික සාටකං දතුං**" ස්වාමීනි මම ජීවිතාන්තය දක්වා සංඝයාට වැසි සළු පුදන්නට කැමැත්තෙමියි කීවා ය. "**අනුජානාමි භික්ඛවෙ වස්සික සාටිකං**" මහණෙනි වැසි සළුව අනුදනිමියි වැසි සළුව නියම කොට වදාළ සේක.

මේ වැසි සළුව ද සිවුරකි. එහෙත් සඟල සිවුරු ආදියට වඩා දිග පළලින් වැඩි ය. ප්‍රයෝජනයට ගත හැක්කේ වැසි සාරමස පමණකි. මෙය තමන් ම කැප කරුවන්ට දන්වා වුවත් පිළියෙළ කරවා ගත හැකි ය. සොයා ගත හැකි ය. එහෙත් හැම කාලයෙහි ම එය සෙවිය නො හැකි ය. ග්‍රීෂ්ම ඍතුව අවසන් වන්නට මසක් තබා සෙවිය හැකි ය. ඊට ප්‍රථම සෙවීම හෝ පෙරවීම හෝ නොකළ හැකි ය.

මේ වැසි සළු සිවුර මෙකල කිසිදු බෞද්ධ රටක නැත. මෙහි දිග පළල කියා ඇතත් තනන අයුරු කොතැනකවත් සඳහන් නො වෙයි. ඒ නිසා ශික්ෂාගරුක මහ තෙරවරුන් නියම පිළිවෙළ නොදන්නා හෙයින් "බුද්ධ නියමය උල්ලංඝනය වේය" යි බියෙන් එය තනා ගන්නවත් උත්සාහ නො කරති. එසේ වුව ද මේ සිවුර සමහර පළාත්වලට ඉතා ම අවශ්‍ය ය. විශේෂයෙන් වස්සාන කාලයෙහි ඉන්දියාවේ සහ ලංකාවේ නුවරඑළිය වැනි උඩරට පළාත්වලට ද මෙය ඉතා අවශ්‍ය බව කිව යුතු ය. මේ වැසි සළු සිවුර හිස පටන් ඇඟත් සිවුරුත් වැසෙන්නට පොරෝනා එකකි. වැසි කල මෙය පොරවා ගත් කල්හි කුඩයක් නැතිව ද නොතෙමී යා හැකි වැසුම් කබායක් (ඕවර් කෝට් එකක්) වැන්නක් විය යුතු යයි අනුමාන කළ හැකි ය.

## වස් ආරාධනාව

දයකවරුන්ගේ ආරාධනාවක් ලැබුණත් නොලැබුණත් සුදුසු ස්ථානයක් නොලැබීම වැනි බාධාවක් නැතොත් භික්ෂූන් විසින් වස් විසිය යුතු ය. වස් ආරාධනා කරන්නේ දයකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා ය. මෙකල මෙන් නොව පෙර භික්ෂූන් වහන්සේ නිතර එක තැන වාසය නොකිරීම නිසා දයක පින්වතුනට අවශ්‍ය අවස්ථාවන්හි ධර්ම ශ්‍රවණය හෝ ධර්ම සාකච්ඡාව හෝ සුලබ නො වී ය. එහෙයින් ම ගුණ ධර්ම පිරුම ද පහසු නො වී ය. යම් පළාතක දයකවරුනට භික්ෂූන් වස්වසවා ගන්නට ලැබුණොත් ඒ පළාත් වාසීන්ට සිවු පසයෙන් උපස්ථාන කොට පින් ලබා ගැනීමටත් වඩා ශීල භාවනාදී ගුණ ධර්ම පිරීමෙන් යහපත සැලැසෙන්නේ ය. දන් දීම නම් භික්ෂූන් චාරිකාවෙහි යෙදෙන කාලයන්හිත් කළ හැකි වේ. ඒ නිසා වස් වසවා ගන්නා දයකයන්ගේ පරමාර්ථය විය යුත්තේ තමන් උපස්ථාන කරන භික්ෂූන් ආශ්‍රයෙන් ගුණ ධර්ම දියුණු කර ගැනීම ය. ඇතැම් අවස්ථාවන්හි දී බුදුරජාණන් වහන්සේ ද සිවු පසයෙන් උපස්ථාන කොට පින් ලබාගන්නට යැයි කළ වස් ආරාධනා ප්‍රතික්ෂේප කොට (ඉවත දමා) ගුණධර්ම දියුණු කර ගැනීමට ආධාරයක් වශයෙන් වැඩ සිටින්නැයි කළ ආරාධනා ඉවැසූ බව පෙනේ.

වස් කාලය භික්ෂූන් ද එක තැනක නැවතී විශේෂ කර්මස්ථාන වැඩීම කරන නිසාත්, දයකවරු ද සාමාන්‍ය කාලවලට වඩා සීල භාවනාදි ගුණධර්ම පිරීමෙහි නිරත ව කල්ගෙවන නිසාත් පුණ්‍යකාලය හැටියට ද සම්මත විය. ඒ නිසා කඩ නො කොට නොවැස්සත් වස් කාලයෙහිවත් එක තැනකට වී විසීම හැම ලෙසින් ම සුදුසු ය.

වස්වසන දින ඒ ඒ තැන්වල මහ තෙරුන් වහන්සේ විසින් අවශේෂ භික්ෂූන්ට කරන ලද අවවාදවලින් ඒ කාලය තුළ භික්ෂූන් ගේ අප්‍රමාද භාවය ද මැනැවින් පැහැදිලි වෙයි. **"කෙසේ ද ඇවැත්නි, අප අප්‍රමාද විහාරී විය යුතු නොවේ ද? අපි ජීවමාන බුදුරජාණන් වහන්සේ ගේ කමටහන් ලැබ ආවෝ වෙමු. සටකපට බැවින් බුදුවරුන් ගේ සිත නොගත හැකි ය. බුදුවරු කලණ අදහසින් ම සිත් ගත යුත්තෝ ය. ප්‍රමාදව වාසය කරන්නවුන් හට අපාය සිය ගේ හා සම ය. ඒ නිසා ඇවැත්නි, අප්‍රමාද ව මහණදම් පුරවු"** මේ වනාහි චක්ඛුපාල තෙරුන් වහන්සේ සෙසු භික්ෂූන්ට වස් වසන දින අවවාද කළ ආකාරය යි.

## ලංකාවේ ප්‍රථම වස්සාවාසය

ශ්‍රී බුද්ධ වර්ෂ 236 වැන්නෙහි පොසොන් පුර පසළොස්වක් ද මිහිඳු මහරහතන් වහන්සේ ශ්‍රී ලංකාද්වීපයට වැඩම කළ සේක. එම වස ඇසළ පුණු පොහෝද අරිට්ඨ කුමරුන් ප්‍රධාන සපණස් (56) දෙනා තුම්බුරු සීමා මාලකයෙහි පැවිදි උපසපන් වූහ. මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන දඹදිවින් වැඩම කළ භික්ෂූහු ද මේ නවොපසම්පන්න භික්ෂූහු ද දේවානම්පියතිස්ස රජිඳුන් විසින් කණ්ඨක චෛත්‍යස්ථානයෙහි කැරවූ අට සැට ලෙන්හි විස් විසූ සේක. මෙය ලංකාවේ ප්‍රථම වස්සාවාසය යි. එද පටන් ලක්වැසි ගිහි පැවිදි දෙපස ම විශේෂ පුණ්‍ය කාලයක් ලෙස වස් කාලය ගත කිරීම මේ තාක් අත්හිටවී නැත.



# ආගම් ඇදහීම හා පිළිපැදීම

**කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ නාරද බෞද්ධ ධර්මායතනාධිපති රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති තලල්ලේ චන්දකිත්ති හිමිපාණන් විසිනි.**

බුදුරජාණන් වහන්සේගේ කාලයේ ධම්මාරාම නම් ස්වාමීන් වහන්සේ නමක් වාසය කළා. උන්වහන්සේ අප්‍රමාදී ව වාසය කළ කෙනෙක්.

ඉතින් බුදුරජාණන් වහන්සේ අවුරුදු හතළිස් පහක් ලෝක සත්ත්වයාට හිත සුව පිණිස අපරිමිත සේවාවක යෙදී පිරිනිවන් පාන්නට සූදනම් වී මල්ල රට උපවත්තන සල් උයනේ සල් ගස් දෙකක් අතර සැතපී සිටියා. මේ සංවේගජනක පුවත ඇසූ බොහෝ දෙනා කණගාටුවෙන් හඬමින් කඳුළු සලමිනුයි හිටියේ. බොහෝ දෙනා බුදුරජාණන් වහන්සේ අසලට ම වී සිටියා.

එහෙත් මේ ධම්මාරාම ස්වාමීන් වහන්සේ කඳුළු සලන්නේ ද නැතිව පසෙකට වී සන්සුන් ව භාවනා කරමින් සිටියා. ඒ දුටු අනෙකුත් ස්වාමීන් වහන්සේලා මේ ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේට සෙනෙහසක් නැති ආදර ගෞරවයක් නැති කෙනෙක් හැටියට සලකා දෙස් කිව්වා. මේ සිද්ධිය පිරිනිවන් මඤ්චකයේ වැඩ සිටි බුදුපියාණන් වහන්සේට ද අසන්න ලැබුණා. ඒ පිළිබඳ කරුණු විමසූ බුදුරජාණන්

වහන්සේ එම ස්වාමීන් වහන්සේට තමන් වෙත පැමිණෙන ලෙස දැන්වූවා. එසේ පැමිණි පසු මේ කථාවේ ඇත්ත නැත්ත විමසුවා. එවිට ධම්මාරාම ස්වාමීන් වහන්සේ තථාගතයන් වහන්සේ තව ටික මොහොතකින් පිරිනිවන් පානා බැවින් ඊට කලින් තමන්ට විමුක්තිය ලබා ගෙන සසර දුකින් මිදෙන්නට අවශ්‍ය නිසා තමන් අප්‍රමාදීව භාවනා කළ බවත් එසේ නොමැති ව තමන් තුළ තථාගතයන් වහන්සේ කෙරෙහි අල්පමාත්‍ර වූත් අමනාපයක් අනාදරයක් නොමැති බව දැන්වූවා. එවිට බුදුපියාණන් වහන්සේ මෙම ස්වාමීන් වහන්සේගේ ක්‍රියාව පිළිබඳව අතිශයින් ම පැහැදී තුන් වතාවක් සාදු නද දී එම ක්‍රියාව අනුමත කළා. එසේ ම මෙබඳු ප්‍රකාශයක් ද කළා. **නහි මය්හං මාලා ගන්ධාදීහි පූජං කරොන්තා මම පූජං කරොන්ති නාම. ධම්මානුධම්මපටිපජ්ජන්තා මං පූජෙන්ති නාම.**

**"මලින් සුවඳින් මා පුදන්නෝ නියම ලෙසින් මා පුදන්නෝ නොවෙති. ධර්මානුධර්ම ප්‍රතිපදව අනුගමනය කරන්නෝ ම නියම ලෙසින් මා පුදන්නෝ වෙති."**

ධම්මපදට්ඨ කථාවෙහි ධම්මාරාම වස්තුවෙහි එන මේ කථා පුවත වත්මන් සමාජයට කියා දෙනුයේ විශාල පාඩමක්. මෙකල මිනිසාගේ පැවැත්මට බලපාන අධ්‍යාපනය සෞඛ්‍යය පමණක් නොව සමාජ සේවාමය කටයුතු පවා වාණිජකරණයට හසු වී ඇති බව පෙනෙනවා. ඒ සියල්ල මුදල් ඉපයීමේ මාර්ග හැටියට භාවිත වෙන බව දක්නට ලැබෙනවා. මිනිසුන් විසින් හදගත් ආගම් දර්ශන මතවාද පවා මුදලට යට වී වාණිජකරණය වී ඇති බවක් පෙනෙනවා. සියලු වාණිජකරණයන්ට වඩා මිනිසාගේ ආධ්‍යාත්මික ගමනට මඟ පෙන්වන සත්‍ය සොයා යන මාවත ලෙසින් දක්වන ආගම් වාණිජකරණයට හසුවීම ඒ ඒ ආගම් අදහන අයගේ ආධ්‍යාත්මික ගමනට ඇති කරන්නේ ද බලවත් බාධාවක්.

විවිධ වූ විෂම වූ ලෝකයක ජීවත් වෙන මිනිසා එකම මානව වර්ගයකට අයත් වුවත් පුද්ගල චරිතාංග සිතිවිලි හා අදහස් වශයන් එකිනෙකාට වෙනස් ආකාරයකටයි හැසිරෙන්නේ. ඒ අනුව ලෝකයේ විවධ මතධාරීන් පහළවීම ස්වාභාවයක්. එසේ ම විවිධ ආගම් ලෝකයේ පහළවීම ද ස්වභාවයක්. ආගමික ඉතිහාසය දෙස බලන විට මිනිසාට ආගමක් අවශ්‍ය වූයේ පරලොව ජීවිතය යහපත් කර ගන්නවාටත් වඩා මෙලොව දී එදිනෙද ජීවිතයේ දී පැමිණිය හැකි කරදර බාධා හිරිහැරවලින් මිනිසාට මිදෙන්නට අවශ්‍ය වූ නිසයි. පුද පූජා බලි තොවිල් ශාන්ති කර්මාදිය මෙන් ම විවිධ යාඥ විධි දේශනාවන් චාරිත්‍ර වාරිත්‍ර හා මුසුව පරම්පරාවෙන් පරම්පරාවට දීර්ඝ කාලයක් තිස්සේ පැවතගෙන පැමිණියේ ඒ මානව අවශ්‍යතාව නිසයි. මිනිසාගේ මේ ලෝකයේ ජීවිතය සුවපත් කිරීමට සැකසුණු විවිධ පුද පූජාවන් ආමිසය හා බැඳී පවතින නිසා මෙකල බොහෝ දෙනා විසින් ප්‍රමුඛත්වය දෙනු ලබන්නේ ආමිස පූජාවන්ට පමණයි.

ගසක පැවැත්මට පොත්ත අවශ්‍ය වන්නා සේ ම ආගමික පැවැත්මට ජනප්‍රිය භාවය ද අවශ්‍ය කරනවා. ඒ අනුව පුදපූජාදිය අනවශ්‍ය දෙයක් නොවන බව වටහා ගත හැකියි. එහෙත් මෙකල බොහෝ දෙනා ඇදහීමට මුල් තැන දී පිළිපැදීම මුළුමනින්ම අමතක කර ඇති සෙයක් පෙනෙනවා. එය ඔවුන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනයට විශාල පාඩුවක්. තම තමන්ගේ ආධ්‍යාත්මික දියුණුව ඇති වන්නේ මේ ධර්මය පිළිපදිනා ආකාරය මතයි.

ආගම් විවිධයි. එසේ වුවත් බොහෝ ආගම්වලින් උගන්වන්නේ මානව වර්ගයාගේ යහපත ම යි. එසේ වූයේ නමුත් මෙකල බොහෝ ආගම් ඒ ඒ ශාස්තෘවරුන් නොකියූ

දෙය කියූ දෙයක් ලෙසින් ද කියූ දෙය නොකියූ දෙයක් ලෙසින් ද දක්වමින් මූලික ආගමික ඉගැන්වීම කණපිට පෙරළාගෙන ඒ ඒ ආගම් අතර පවා ගැටුම් ඇති කරන තත්ත්වයකට ඒ ඒ ආගම්වල අනුගාමිකයන් පත් වී ඇති බව අවබෝධ කරගත හැකියි. මේ තත්ත්වය නිසා මනුෂ්‍ය ඝාතන පවා සිදු වන බව නොරහසක්. එහෙත් වාසනාවකට මෙන් බුදු දහම තුළ පවා ථේරවාද මහායාන වජ්‍රයාන වශයෙන් විවිධ බෙදීම් තිබුණත් ඒ බෙදීම් තුළ ගැටීම් ඇති කර ගන්නා තත්ත්වයක් නැහැ. ඒ අනුව අභ්‍යන්තර මතවාද නිසා මිනී මරා ගන්නේ නැති එක ම දහම බුදුදහමයි. ඒ ගැන සිතා අපට සතුටුවිය හැකියි. ලෝකයේ ජනගහන අනුපාතය අනුව බුදුදහම අදහන මිනිසුන්ගේ සංඛ්‍යාව මත බුදුදහම පස්වන ස්ථානයෙහි ලා සැලකෙන්නේ ද ඒ තත්ත්වය ඉතා ශීඝ්‍රයෙන් දියුණු වන්නේ ද බුදුදහම තුළ පවතින මේ සාමකාමී පරිසරය නිසයි.

අද අප අතර පවතින බොහෝ ආගම් ප්‍රචාරයට (Propaganda) සහ ප්‍රදර්ශනයට (Exahibition) පමණක් සීමා වී ඇති බවක් පෙනෙන්නට තිබෙනවා. ආගමික උපයෝගීතාව තිබෙන්නේ එය ප්‍රායෝගිකව පුරුදු කරන විටයි. බොහෝ ආගම් මහේශාක්‍ය ලීලාවෙන් වැජඹෙන, එල නොදරන, එසේත් නොමැතිනම් අඩුවෙන් එල දරන ගස් බවට පත් වෙලයි තිබෙන්නේ. ආගම් එබඳු තත්ත්වයකට පත් ව ඇත්තේ ආගමේ ඇති අඩුපාඩුවක් නිසා හෝ ශාස්තෘවරයාගේ ඇති වැරැද්දක් නිසා නොව එය අදහන අයගේ දුර්වලකම් නිසායි.

වෙළෙඳ පොළට කෘත්‍රිම (ඉමිටේශන්) රත්රන් පැමිණි විට වෙළෙඳ පොළේ ඇති නියම රත්‍රං හඳුනාගත නොහැක්කා සේ වාණිජකරණයට ලක් ව ඇති ලෝකයක නියම ධර්මයද නිසි ලෙසින් හඳුනාගැනීම අපහසු කටයුත්තක් වෙලයි තිබෙන්නේ.

බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ වාසය කරන සමයෙහි ඉන්දියාවේ ද තිබුණේ එවැනිම තත්ත්වයක්. විවිධ දෘෂ්ටිවාද මතවාද පුද්ගලවාද ආදී වශයෙන් බොහෝ වාද පැන නැඟී තිබුණ නිසා එකල මිනිසුන්ට සත්‍ය කුමක් ද අසත්‍ය කුමක් දැයි සොයා ගැනීමට බොහෝ වෙහෙසෙන්නට සිදු වුණා. එකල කිං කුසල ගවේසී (කුසලය කුමක් ද) කිං සච්ච ගවේසී (සත්‍ය නම් කුමක් ද) වශයන් මිනිසුන් සත්‍ය සෙවූ බව සඳහන් වෙනවා. එබඳු පිරිසකගේ මානසිකත්වය අවබෝධ කරගත් නිසයි  බුදුරජාණන් වහන්සේ කාලාම, බ්‍රහ්මජාල, අග්ගඤ්ඤ, තේවිජ්ජ වැනි සූත්‍ර දේශනා කළේ. ඒ තුළින් මිනිසුන්ට සත්‍ය වටහා ගැනීමට බුදුරජාණන් වහන්සේ උපකාර කළා.

ඕනෑම ආගමක් පවත්වාගෙන යෑමට එහි වගකීම ගෙන කටයුතු කරනා පිරිසක් ද සිටිය යුතු යි. ඒ පිරිස අනිවාර්යයෙන් ම දැන උගත් පිරිසක් විය යුතුයි. ඒ වගකීම් දරා කටයුතු කරන පිරිස බුදුදහමෙහි පූජ්‍ය පක්ෂය නමින් හඳුන්වනවා. අනෙකුත් ආගම්වල නම් පූජක නාමයෙන් හඳුන්වනවා. ආගම දේශනා කිරීම ආගමට හා එම ආගමට අයත් වන සංස්කෘතියට අදාළ පුදපූජා ශාන්තිකර්ම චාරිත්‍රවාරිත්‍ර සිදුකිරීමත් පොදුවේ මේ පිරිසට අයත් කාර්යයන් වෙනවා. බුදුපියාණන් වහන්සේගේ සසුන් කෙතෙහි වන පූජ්‍ය පක්ෂය ධර්ම මාර්ගයෙහි තමන් ද ගමන් කරමින් අන් අයට ද මඟ පෙන්වා දෙනවා. පූජක පිරිස කරනුයේ දෙවියන් වහන්සේ හෝ මහා බ්‍රහ්මයා අතර සම්බන්ධීකරණය සිදු කිරීමයි. එහෙත් බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය ඊට වඩා වෙනස් එකක්. දේවාලවල කපුරාලගේ කාර්යභාර්ය බෞද්ධ භික්ෂූන් වහන්සේලාට අදාළ එකක් නොවෙයි. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූයේ දුකින් පෙළෙන සත්ත්වයා ඒ සාංසාරික දුක් වලින් මුදවනු පිණිසයි. බෞද්ධ භික්ෂූන්ගේ ද කාර්යය විය යුත්තේ බහුජන

හිතාය බහුජනසුඛාය ලෝකානුකම්පාය වශයෙන් බුදුරජාණන් වහන්සේ සිදු කළ ලෙසින් ම ලෝවැසියාගේ හිතසුව පිණිස නිවැරදි ව ධර්මය කියා දී දුකෙන් මිදෙන මාවත පෙන්වා දීමයි. බෞද්ධ භික්ෂූන් වහන්සේලා පූජ්‍ය පක්ෂයට අයත් වන්නේ ඒ නිසයි.

ජනතාව බෞද්ධ භික්ෂූන් වහන්සේලා පූජනීයත්වයෙන් සැළකුවේ ඒ කැපවීම මනා ලෙස අවබෝධ කරගෙනයි. ඒ ජනතා පූජනීයත්වයට පත් ස්වාමීන් වහන්සේලා හැම පුද පූජාවන්ට නිසි සේ තමන්ගේ පැවැත්මද හද ගත්තා. තමන් වහන්සේලා පිළිවෙත් දහම් පුරන ගමනේ ම තම දයකයන්ට නිසි මඟ පෙන්වා දුන්නා. තමන් වහන්සේලා දහමෙහි සුවය විඳින ගමනේ ම තම දයකයන්ට ද ඒ සුවය ලබා දෙන්නට කටයුතු කළා. මෙසේ පැවතියත් කල් යාමේ දී මහජන අවශ්‍යතාවන් ද නිසා පුද පූජා පිරිත් දේශනා ශාන්ති කර්ම වැනි දේවල් ආරම්භ කරන්නට ස්වාමීන් වහන්සේලාට සිදුවුණා. ඒ අනුව ප්‍රතිපත්තියටත් වඩා පුදපූජාවලටත් උත්සව සහ සම්මාදම් කටයුතුවලටත් මුල් තැන ලැබුණා. බුදුදහම කියන්නේ අන්‍ය ආගම් මෙන් පුදපූජාවලට ම පමණක් සීමා වුණ ආගමක් නොවෙයි. බුදුදහමෙහි ප්‍රධාන ඉලක්කය වන්නේ ධම්මානුධම්ම ප්‍රතිපදාව තුළින් අපේක්ෂා කරන පරම සුවය වන නිර්වාණය අවබෝධ කිරීමයි. බුදුදහමට ඇතුළත් ව ඇති පුදපූජා විධි ක්‍රමයන්ගෙන් ලෞකික වශයෙන් සුවයක් සලසා ගත හැකි වුවත් එහි හරය සොයන කෙනෙකුට මෙහි වන ප්‍රතිපදාව දෙසට තම නෙත් යොමු කළ යුතු ම වෙනවා.

ගිහි බෞද්ධයන් නිරන්තරයෙන් තමන්ගේ ජීවිත අර්ථවත් කර ගැනීමට භික්ෂූන් වහන්සේලාගේ අවවාද අනුශාසනා ලබා ගත යුතුයි. එසේ වූයේ නමුත් උන් වහන්සේලා

ඇසුරු කරද්දී ගින්දර ඇසුරු කරන්නාක් මෙන් පරිස්සම් විය යුතුයි. උන් වහන්සේලා ඇසුරු කරද්දී නිසි ගෞරවය ලැබෙන ලෙසට ඇසුරු කළ යුතුයි. බොහෝ දෙනා ස්වාමීන් වහන්සේලා සමග හිතවත් වූ පසු තිබෙන ගෞරවය අඩු කර ගන්නා බවක් දක්නට ලැබෙනවා. තමන්ගේ ජීවිතයට දහම් ආලෝකය ලබා ගනු පිණිස මිස වෙනත් ද්‍රව්‍යාත්මක උදව් උපකාර පිණිස ස්වාමීන් වහන්සේලා ඇසුරු නොකළ යුතුයි. ආමිස දානයෙන් නිරන්තරයෙන් ම උදවු උපකාර කරන්නා වූ ගිහියනට ධර්මදානයෙන් උපකාර කරන්න යන්න බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාවයි. **(ගිහීනමුපකරොන්තානං - නිච්චං ආමිසදානතෝ - කරෝථ ධම්මදානේන - තේසං පච්චුපකාරකං)** ධර්මදානය කරන භික්ෂූන් වහන්සේලා තුළින් වෙනත් භෞතික දේ බලාපොරොත්තුවීම සුදුසු දෙයක් නොවේ. එක් විසි අනේසනයන්ගෙන් වෙන් ව වාසය කරන්නා වූ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගෙන් නොගැළපෙන දේ ඉල්ලා සිටීමෙන් උන් වහන්සේලා ද අපහසුතාවන්ට පත් වෙනවා. භික්ෂූන් වහන්සේලා ද එබඳු ඉල්ලීම් තුළින් තමන් වහන්සේලා අපහසුතාවට පත්වන බව ගිහියන්ට පැවැසිය යුතු වෙනවා.

භික්ෂූන් වහන්සේලා කියන්නේ ශ්‍රද්ධාවන්ත දායකයන්ට නම් මහත් සම්පතක්. භික්ෂූන් වහන්සේලාගෙන් ලැබෙන කල්‍යාණ මිත්‍ර සම්පත්තිය මේ ලෝකයේ වෙසෙන බොහෝ දෙනකුගෙන් ලැබෙන්නේ නැහැ. ගිහි සමාජයේ වෙසෙන හිතවතුන් කෙතරම් සමීප ව සිටියත් ඇතැම් විට තමන්ගේ යහළුවා තමන්ට වඩා දියුණු වෙනවා දකින විට සිතෙහි අල්ප මාත්‍ර වශයෙන් හෝ නොසතුටක් ඇති විය හැකියි. එහෙත් ස්වාමීන් වහන්සේ නමක් කිසි දිනෙක තමන්ගේ දායකයන් දියුණු වෙනවා දකින්නට අකමැති නැහැ. ඔවුන්ගේ දියුණුවේ දී සතුටු වෙනවා. ඒ කල්‍යාණ මිත්‍රත්වයේ ස්වභාවයයි. ඒ නිසා

එබඳු කල්‍යාණමිත්‍ර ස්වාමීන් වහන්සේ නමකගේ ඇසුර සෑම ජීවිතයකට ම අවශ්‍ය යි.

සැදැහැවත් අය ස්වාමීන් වහන්සේ නමකගේ දැකීම පවා මංගල කාරණයක් හැටියටයි සලකන්නේ. **සමණානං ච දස්සනං - ඒතං මංගලමුත්තමං** යනුවෙන් මංගල සූත්‍රයේ සඳහන් කර ඇත්තේ ද එයයි. සදහම් මඟ පෙන්වා දෙමින් තමන් ඇසුරු කරන අයට දෙලොව දියුණුව පිණිස පමණක් නොව ලෝකෝත්තර සැනසිල්ල වන නිවන පිණිස ද මඟ පෙන්වා දෙන සිල්වත් ගුණවත් කල්‍යාණමිත්‍ර ස්වාමීන් වහන්සේලා මනා ලෙස ඇසුරු කරන ගමනේ උන්වහන්සේලා රැක ගැනීමත් නිසි වූ පරිදි ඇසුරු කිරීමත් දයකයන්ගේ වගකීමක්. එසේ නොමැති ව කෝක නම් වැද්ද සෙයින් ශ්‍රමණයන් වහන්සේලා දැකීම පවා අප්‍රසන්න කාර්යයක් හැටියට සලකා ගෙන ශාසනය කෙරෙහි කිසිදු ගෞරවයක් නැති ව ස්වාමීන් වහන්සේලාට දෙස් නගමින් කටයුතු කිරීම බොහෝ පව් පිරෙන ක්‍රියාවක්. එබැවින් කෝක වැදි න්‍යායට අනුව කටයුතු කරන්නේ නැතිව සසුන් මඟෙහි පිළිවෙත් පුරන ස්වාමීන් වහන්සේලාට නිසි ගෞරවය සැලසෙන සේ උන් වහන්සේලා අබියස කටයුතු කරන්නට හැම දෙනා ම සිතට ගත යුතු වෙනවා.



# ඇරඹුම නැවතුම

"සසුන් රුවන් "

ඇරඹුමක් ද? නැවතුමක් ද?
කෙසේ ද වටහාගන්නේ................
හැකි ද එලෙසට ඇති ව නැතිවන
අරුමැති දෙයක් ජීවිතයෙන් දකින්නට.............
තව ම නම් නැත හැකි වුණේ
ඇයි ද? හේතුව
"සතිය "
ගිලිහී ගොහින් ඔබේ දිවියෙන්
ඉවතට........ඈතට.....
මිරිඟුව පසුපස
ඇසට පෙනෙන මානයේ ඇති දසුනකට
කනට ඇසෙන මානයේ ඇති හඬකට
නාස්පුඩු දෙකට දැනෙන ගඳ සුවඳකට
දිවට දැනෙනා රසයකට
කයෙන් විඳිනා පහසකට
මනසට දැනෙනා අරමුණකට
තව ම ඔබ මේවා පසුපස නොවෙද හති දමමින් දුවන්නේ,
"සතිය " හොරකම් කළ සොරුන්, මොවුන් බව ඔබට නො වැටහේ ද?
ඉතින් තව යමු ද, ඒ මිරිඟු දිය සොය සොයා
නැත එහි ගන්නට කිසිවක්,
නොමැත හරයක් ! හිස් බවක් ම මිස
අකමැති ද, අත් හරින්නට මිරිඟුව
හැකි ය, නිසැකව ම හැකි ය
එහෙත් ඒ කුමකට ද?
ඇරඹුම නැවතුමක් වනු පිණිස........



04 වන කොටස

# වර්තමාන ලෝකයට බුදු දහම පහද දෙන්නකු ගේ මතක සටහන්

අනගාරික ධර්මපාලතුමා විසිනි
(''ධර්මපාල ප්‍රතිරාවය'' කෘතියෙනි)

බුද්ධ ගයාවේ දී, බුදුන් වහන්සේ හිඳ ගෙන සිටි මුල් බෝධි වෘක්ෂයේ අංකුරයක් වන බෝධි වෘක්ෂය දුටු විට, බුරුමයේ ඉතාම නිහතමාන වන්දනා කරු ගේ මෙන් මගේ ආත්මයට ද දැනුණු සාමය අපමණ ය. ඉක්බිති ව පිරමීඩාකාර ව තනන ලද ගඩොළු විහාරය වෙතට ඉතා ගෞරවයෙන් ගිය මම, පැරණි ගල් වැටෙහි කැටයම් පරීක්ෂා කර බැලිමි. එහෙත් මා අවට දක්නට ලැබුණු විනාශයෙන් හා කෙලෙසීමෙන් මම කලකිරීමට පත් වීමි. හින්දු ෆකීර් ආයතනයේ ප්‍රධානියා වූ මහන්තා, සුන්දර ප්‍රතිමා විරූප කර තිබුණේ ය. දීර්ඝ වන්දනා ගමනක අවසානයේ දී සැදැහැවත් බෞද්ධයාට හමු වනුයේ හින්දු දෙවිවරුන්ගේ විරූපී ප්‍රතිමා ය. බෞද්ධයන්ගේ පරිශුද්ධතම සිද්ධස්ථානය, සෑම විට ම බුද්ධාගමට විරුද්ධ වූ මුතුන් මිත්තන් සහිත මිනිසකුගේ පාලනය යටතෙහි පැවතීම ඇත්ත වශයෙන් ම මහා දුෂ්ට අපරාධයක් බව පෙනී යයි.

සති කිහිපයක් එහි ගත කර, පෙරළා ලංකාවට යෑමට මම අදහස් කර ගෙන සිටියෙමි. මා ළඟ තිබුණේ රුපියල් කීපයකි. එහෙත් විහාරයේ තත්ත්වය දුටු මම, එය බෞද්ධ පාලනය යටතට ගැනීම සඳහා උද්ඝෝෂණයක යෙදෙන්නට පටන් ගතිමි. ලෝකයේ ප්‍රධානපෙළේ බෞද්ධයන් සමග ලියුම් ගනු දෙනු කරන්නට පටන් ගත් මම, බුද්ධ ගයාව ශිව වන්දනා කරන හින්දු ෆකීර්ලා ගෙන් ගළවා ගන්නා ලෙස ඔවුන් පෙළඹවීමි. 1891 මැයි මස 31 වන දින, මම ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමේ ද ඉන්දියාවේ බුද්ධාගම නඟා සිටුවීමේ ද අදහසින් මහා බෝධි සමාගම ආරම්භ කළෙමි. ඉන්දියාව අවුරුදු හත් සියයක කාලයක් මුළුල්ලේ සිය ශ්‍රේෂ්ඨත ම ආචාර්යවරයා අමතක කර දමා තිබිණ. 1892 දී තව මත් පවත්නා වූ ද මහා බ්‍රිතාන්‍යයේත් එක්සත් ජනපදයේත් බෞද්ධයන් අතර හොඳින් ප්‍රකට වූ ද සමාග මේ "මහා බෝධි සඟරාව" ආරම්භ කළෙමි.

මේ සඟරාවේ පළමුවන කලාපයේ පිටපතක්, 1893 දී චිකාගෝවේ ලෝක කලම්බියානු ප්‍රදර්ශනයේ ලෝක ආගම් පිළිබඳ පාර්ලිමේන්තුවේ සභාපති වූ ආචාර්ය ජෝන් හෙන්රි බැරෝස්ට යවන ලදී. මෙය ලැබුණු බව සඳහන් කර ඔහු එවූ ලියමනෙහි, එම සම්මේලනයේ උපදේශක මණ්ඩලයෙහි සේවය කරන ලෙස මට ආරාධනා කරමින්, බෞද්ධ නියෝජිතයකු එහි එවිය හැකි ද යි මගෙන් අසා තිබිණි. මම ඔහුට නම් ලැයිස්තුවක් තැපැල් කොට හැරියෙමි.

ඉක්බිති ව ඉතා ප්‍රාණවත් ලියුම් කියුම් හුවමාරුවක් ආරම්භ වූයේ ය. මා යෝජනා කළ, ලංකාවේ ඉතා සම්භාවනීය බෞද්ධයෝ සියල්ලෝ ම වැඩි මහලු අය වූහ. ඔවුන් චිකාගෝව ගැන අසා තිබුණේ නැති තරම් ය. එ මෙන් ම වයසින් ද වැඩී සිටි ඔවුහු මේ ගමන යෑමට ප්‍රතික්ෂේප කළහ. අවසානයේ දී කර කියා ගත හැකි කිසිවක් නොතිබුණෙන් ආචාර්ය බැරෝස් මට මෙසේ ලියා එවී ය. "ඔබ ම නියෝජිතයකු වශයෙන් සම්මේලනයට එන්න". එ කල මගේ වයස අවුරුදු විසි හතරක් පමණ වී ය. එ හෙයින් සිංහල බෞද්ධයන් නියෝජනය කළ යුතු ගෞරවාර්හ භික්ෂූන් වහන්සේ කෙනෙකුන්ගේ තැන ගැනීමට තරම් මා සුදුස්සකු නො වෙතියි මම කල්පනා කළෙමි. එහෙත් ප්‍රිය මනාප තැනැත්තෙකු වූ ආචාර්ය බැරෝස් අසතුටට පත් කිරීමට මා තුළ කැමැත්තක් නො වී ය. එම නිසා, බෞද්ධ ශිෂ්‍යයකුගේ සුදු ඇඳුමෙන් සැරසුණු මම අවුරුදු හාර සීයයකට පෙර කොළොම්බස්ගේ අමෙරිකාව සොයා ගැනීම අනුස්මරණය කිරීම් වස්, මිචිගන් විල අසල චිකාගෝ ජනතාව විසින් ඉදි කරන ලද සුදු නගරයට ගියෙමි.

බුදුන් වහන්සේ ඉන්දීය නගරවලට සිය පණිවිඩය බෙදා දෙන ලද කාලයේ දී, මහා ඝන වනාන්තරයක් ව තිබුණා වූ ද පාපයෙන් සුඛෝපභෝගයෙන් හා සංස්කෘතියෙන් දැනට ම මහලු වී ඇත්තා වූ මේ නගරය, ආගමික සහනශීලීතාවයෙන් වර්තමාන ලෝකයට නිදර්ශනයක්

ගෙනහැර පෑවේ ය. මුස්ලිම්වරු ද බ්‍රාහ්මණයෝ ද බෞද්ධයෝ ද යුදෙව්වෝ ද සෑම නිකායක ම ක්‍රිස්තියානීහු ද තම තමන්ගේ ඇදහිලිවල සත්‍යයන් පහදා දුන්නෝ ය. මම මේ සම්මේලනයේ දී බුදුන් වහන්සේට ලෝකයේ ණය ගැති භාවය ගැන ද ක්‍රිස්තියානිය හා බුද්ධාගම ගැන ද 1837 පටන් කරන ලද වැදගත් පුරාවිද්‍යාත්මක සොයාගැනීම්වලින් ද පරිවර්තන මඟින් ද ඉන්දීය ඉතිහාසයේ සැඟවුණු තැන්වලට ද බුද්ධාගමට ද මහත් ආලෝකයක් සලසා දුන් බටහිර ප්‍රාචීන විශාරදයන් ගැන ද කථා කළෙමි. ඉවසීමත් අනෙකාගේ මතවලට ගරු කිරීමත් මේ සම්මේලනයෙහි කැපී පෙනුණු ලක්ෂණයක් වී ය.

එය, සියලු ම ආගමික ඥාත්‍රයන් හා ශ්‍රාවකයන් එක් රැස් වී, තම තමන්ගේ දෙවිවරුන් ගැන ද ආගමික පරමාදර්ශයන් සාක්ෂාත් කර ගැනීම සඳහා තම තමන් කරන්නා වූ යත්නයන් ගැන ද පොදුවේ සාකච්ඡා කළ පොදු වේදිකාවක් වී ය. මම උද්දමයට පත් මානසික තත්වයකින් ද මිනිසාගේ සහෝදරත්වය පිළිබඳ ව උතුම් වූ බලාපොරොත්තුවකින් ද නුදුරු අනාගතයේ දී ම පහළ විය හැක්කා වූ ක්‍රිස්තියානියාත් යුදෙව්වාත් මහමදගමිකයාත් බ්‍රාහ්මණයාත් බෞද්ධයාත්, ජාති කුල ගෝත්‍ර පිළිබඳ නියම දැනුමක් නොමැතිකම නිසා ද පටු කල්පනාකාරි භාවය නිසා ද ඇති වන අහිතකර හැඟීම්වලින් ද, දැඩි ආගමික විශ්වාස නිසා ඇති වන ද්වේෂ සහගත ආවේගවලින් ද තොර වූ "යුතෝපියාවක්" හෙවත් සර්ව සුන්දර රාජ්‍යයක් ගැන අපේක්ෂාවකින් ද එම සම්මේලනයෙන් පිට වී ආවෙමි.



# ඔබ නියම බුදු සවුවකු වන්නේ කෙසේ ද?

"මුතු සීයා" විසිනි

ආදරණීය දුවේ, පුතේ,

ඔබ අප උපතින් බුදුනුවන් වුවත්, නියම බුදුනුවන් වශයෙන් සැලකෙනුයේ, පිළිගැනෙනුයේ තිසරණ පන්සිල් සමාදන් වුව හොත් පමණි. ඔබට නියම බුදු සවුවකු වන්නට ඕනෑ නම් පළමුවෙන් ම උන් වහන්සේට ඇහුම්කන් දෙන්නකු විය යුතු ය. (ශ්‍රාවකයා - සවුවා යන්නෙහි අදහස ඇහුම්කන් දෙන්නා උන් වහන්සේ ගේ කියමන් අනුව කටයුතු කරන්නා යනු යි.) බුදු සවුවා බුද්ධ, ධම්ම සහ සංඝ යන තෙරුවන් කෙරෙහි පැහැදීම ඇති කර ගත යුතු ය; තෙරුවන් සරණ යා යුතු ය. එ විට ඔහු බුදුනු සමාජයේ මුල් ම අවදිය වන සද්ධානුසාරී තත්ත්වයට පිවිසෙනු ඇත. තෙරුවනෙහි සූවිසි ගුණ අවබෝධ කර ගනු ඇත. ඒ කෙරෙහි පැහැදීම ඇති කර ගනු ඇත. පසුවැ එම දහම්හි පිහිටනු ඇත.

**නත්ථි මෙ සරණං අඤ්ඤං - බුද්ධො/ධම්මො/ සංඝො මෙ සරණං වරං - එතෙන සච්ච වජ්ජෙන - හොතු මෙ**

ජයමංගලං යන්න අප විසින් සත්‍යක්‍රියාවක් ලෙස නිතර සිහිපත් කළ යුතු ය.

පාලි අටුවා ඇදුරු බුදුගොස් හිමියන් විසින් රචිත විශුද්ධිමග්ගයෙහි දක්වා ඇති නිර්දේශයන් ගෙන් හත්වැන්නෙහි බුද්ධානුස්සතියෙහි නව අරහාදී බුදු ගුණ ද ධම්මා නුස්සතියෙහි ධර්මයා ගේ ලක්‍ෂණ හය ද සංඝානුස්සතියෙහි සංඝයා ගේ ගුණ නවය ද විස්තරාත්මක ව දක්වා ඇත.

අප පැරණි සිංහල සාහිත්‍යයේ ඉතා ම වැදගත් කෘතින් ලෙස සැලකෙන අමාවතුර ගුරුළුගෝමීන් විසින් ද බුත්සරණ විද්‍යාචක්‍රවර්තීන් විසින් ද පූජාවලිය මයුරපාද පරිවෙණාධිපති බුද්ධපුත්‍ර නම් ස්වාමීන් වහන්සේ විසින් ද රචනා කරන ලද්දේ එක් එක් බුදු ගුණයන් වර්ණනා කරනු පිණිස ය. ඔබ පසු ව වයසින් මුහුකුරා ගිය විට එම පොත් සොයා ගෙන කියවන්න. බුදු බැතිය උපදවා ගන්න. කෝට්ටේ යුගයේ දී දෙවැනි වීදගම හිමියන් විසින් රචිත බුදුගුණාලංකාරය නම් කාව්‍ය සංග්‍රහයේ බුදුන්වහන්සේ ගේ අරහං ගුණය එක් පැදියකින් දක්වා ඇත්තේ මෙසේ යඃ-

රහසත් පව් නො කොට
කෙලෙස’රයනුත් දුරු කොට
නිසි වූයෙන් පුදට
අරහ යයි නම කියති මුනිඳුට

එම පැදිය අනුව (රහසින් වත් පව් නොකරන නිසාත් සංසාරය නමැති චක්‍රයෙහි කෙලෙස් නමැති අර හෙවත් ගරාදි විනාශ කර ඇති නිසාත් චීවර පිණ්ඩපාත සේනාසන ගිලානප්‍රත්‍යය ආදී) පූජා ලැබීමට සුදුසු වූ නිසාත් අරහං යන ගුණය බුදුන් වහන්සේට යෙදේ යැයි දැක්වේ.

මේ අයුරින් සෙසු බුදුගුණ අට ගැන ද ඔබ දහම් පාසලේ දී උගත්තා නේද? ඒ කව්වලත් තේරුම් අවබෝධ කර ගන්න. ඒවා සිත්හි ධාරණය කර ගන්න. ඒ අයුරින් ම ධර්මයේ ගුණ සහ සංඝයා ගේ ගුණ ද ධාරණය කර ගන්න. බුදු සවුවකු වීමේ ආරම්භය එය යි. සසර දුක් කෙළවර කිරීමේ, නිවන්මඟට යොමු වීමේ ඇරඹීම එය යි.

බුදුනු පවුලක ඉපදීම නිසා ම ඔබට ආවේණික වූ සිරිත් විරිත් මාලාවක් තියෙනවා. ඔබ සාමාන්‍ය පාසල් යන්න ඇරඹි දින සිට ම ඉරිදාවල දහම් පාසල් යනවා. දිනපතා මල් පහන් පූජා කරනවා. පෝ දිනයන්හි පන්සල් යනවා. ඇතැම් විට අටසිල් ද සමාදන් වනවා මේවා ඔබ කරන්නේත් ඔබ ගේ දෙමාපියන් ඔබ ලවා කරවන්නේත් බුදුනු වත් පිළිවෙත් ලෙස යි. ඒවා හොඳ පුරුදු. එහෙත් ඒවායේ නියම අරුත අවබෝධ කර ගෙන, සම්‍යක්දෘෂ්ටිය ඇති කර ගෙන, ආර්ය අෂ්ටාංගික මාර්ගයට පිවිසෙන්නට වැර දරන්න. ඔබට තෙරුවන් සරණ යි !